සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය - 2020

---

සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2019 මාර්තු 11 දිනැති ව්‍යාපෘති සංදේශයේ ඇමුණුම ii හි 18 වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පවතින දැඩි රථවාහන තදබදය සැලකිල්ලට ගනිමින්, සීඝ්‍රගාමී සංක්‍රමණික පද්ධතියක් තුළින් ඵලදායී කාර්යක්ෂම සුව පහසු මගී ප්‍රවාහන ක්‍රමවේදයක් හඳුන්වාදීම වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපාන යෙන් මිලියන 246,641 ක් වන අතර 2019 – 2024 කාලය සඳහා සැලසුම් කර තිබුණු අදියර හයක් (06) යටතේ ඉන් රු.මිලියන 286,839 කට සමාන ජපාන යෙන් මිලියන 200,215 ක් සැපයීමට ජපාන සහයෝගීතා නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ අදියර 01 යටතේ අත්සන් කළ අංක එස්එල්-පී 119 දරන ණය පහුසකම් ගිවිසුම අනුව, අදියර එකෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 59,100 කට සමාන ජපාන යෙන් මිලියන 41,252 ක් වූ අතර ඉන් රු.මිලියන 43,037 කට සමාන ජපාන යෙන් මිලියන 30,040 ක් සැපයීමට ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 25 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ව්‍යාපෘතියෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතියේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල (රු.මිලියන) | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 01 පටහැනිව, ඉකුත් වර්ෂයට අනුව ගෙවිය යුතු රු.මිලියන 1,069.32 ක් වූ උපදේශන ගාස්තු වියදම මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි. | 1,069.32 | අදහස් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 01 සටහනට අනුව, උපදේශන වියදම් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | ඉන්වොයිසි ඉදිරිපත් කරන ලද දිනට පැවති ස්ථානීය විනිමය අනුපාතය මත විදේශ විනිමය ගනුදෙනු පරිවර්ථනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම නිසා රු.මිලියන 102.97 ක විනිමය හුවමාරු විචලනයක් නිරීක්ෂණය විය. | 102.97 | - එම - | විදේශ විනිමය ගනුදෙනු දේශීය විනිමය අගයට පරිවර්තනය කිරීමේදී මුදල් ඌන පූර්ණය කළ දින පැවති විනිමය අනුපාතය මත දේශීය මුදලට පරිවර්තනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් මාසය දක්වා වූ කාලයට අදාල ගෙවිය යුතු උපදේශන ගාස්තු රු.මිලියන 744.93 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | 744.93 | - එම - | ගෙවිය යුතු වියදම වගකීම් යටතේ දැක්විය යුතුය. |
| (ඈ) | විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු රු.මිලියන 44.04 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 44.04 | - එම - | අත්තිකාරම් ගෙවීම් ජංගම වත්කම් යටතේ දැක්විය යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ වැඩකටයුතුවල භෞතික කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණ | ප්‍රමාදයට හේතුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීම | ඉඩම් අත්පත් කර ගැනීම | අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමට අපොහොසත් වීම, සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ දුර්වලතාවයන් හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යසාධනයේ ප්‍රගතිය සියයට 10 ක් පමණ විය. | වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේදී ඇති වූ අඩුපාඩු | අදහස් දක්වා නොතිබුණි. | ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යයන් (ක්‍රියාකාරී සැලැස්ම) | ව්‍යාපෘති කළමනාකරණය | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ක්‍රියාකාරී සැලැස්ම, පනතක් සහ ස්වාධීන සංවිධාන ව්‍යුහයක්, සැලසුම් කළ පරිදි සම්පූර්ණ කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලසුම සමාලෝචනය කර අදාල කටයුතු ක්‍රියාත්මක නොකිරීම. | - එම - | ක්‍රියාකාරී සැලසුම නියාමය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ටෙන්ඩර් ලියවිලි සකස් කිරීම සඳහා වූ උපදේශන සේවාව | උපදේශන සේවාව | ටෙන්ඩර් ලියවිලි සකස් කර 2020 ජුනි 30 දිනට පෙර ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් රු.මිලියන 26.13 ක් සමාලෝචිත | සැලසුමට අනුව උපදේශන සේවා කණ්ඩායම් අදාල කාර්ය සඳහා නොයෙදීම. | - එම - | සැලසුම් කල කාල පරිච්ඡේදය තුළ අදාල කාර්යයන් නිම කිරීමට හැකිවන පරිදි ශක්තිමත් හා |

| | | |
|---|---|---|
| වර්ෂය අවසානයට උපදේශන සමාගමට ගෙවා තිබුණි. එසේ වුවත් ටෙන්ඩර් ලියවිලි සකස් කර නොතිබුණි. | | ඵලදායි ව්‍යාපෘති කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.2** මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණද, මාලඹේ සිට බත්තරමුල්ල දක්වා උපයෝගී රැහැන් ඇදීමට අවශය අමුද්‍රව්‍ය පෙරසැරි කිරීමේ කටයුතු ආරම්භ කිරීම පිණිස හා කොළඹ නගරයෙහි පොලොව යටින් දිවෙන විදුලි රැහැන් සම්බන්ධ කිරීම සඳහා රු.මිලියන 36 ක් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි. මෙයින් රු.මිලියන 8 ක් 2021 ජුනි මාසය අවසානය දක්වාම නැවත පියවාගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අත්තිකාරම් නැවත අයකර ගැනීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

**3.3** විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (අ) උපදේශන කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකුට රු.මිලියන 21.43 ක් ගෙවා තිබුණද, ඔවුන් විසින් ඉදිරිපත් කළ වාර්තා සහ එම වාර්තා සමාලෝචනය කිරීමේ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | සියලුම තොරතුරු විගණනයට ලබාදිය යුතුය. |
| (ආ) වටිනාකම රු.මිලියන 3,419.52 ක් වූ ජර්නල් සටහන් 114 කට අදාල ජර්නල් වවුචර් හා උපයෝගී ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නොතිබුණි. | සියලුම තොරතුරු විගණනයට ලබාදිය යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතාවලට අදාල ගැටලු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියේ වැඩකටයුතු නවතා දැමීම නිසා උපදේශන ආයතනය විසින් ඔවුන්ට ලැබිය යුතු එ.ජ.ඩොලර් මිලියන 23.65 ක මුදලද ඇතුලත්ව එ.ජ.ඩොලර් මිලියන 31.36 ක් ඉල්ලුම් කර තිබුණි. මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2021 පෙබරවාරි 23 දින කමිටුවක් පත්කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පත්කළ කමිටුව විසින් නොපමාව සාකච්ඡා කටයුතු සිදු කිරීම ආරම්භ කළ යුතුය. |
| (ආ) | උපදේශන ආයතනය විසින් ලබාදී තිබුණු වාර්තාවන් පදනම් කරගෙන මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික සහභාගීත්ව (PPP) ව්‍යාපෘතියක් ලෙස දිගටම කරගෙන යාමට යෝජනා කර තිබුණි. එසේ වුවත්, 2021 දෙසැම්බර් මාසය අවසානය වන විට වර්ෂයකුත් මාස 6 ක් ගත වී තිබුණද නව ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් ඵලදායි ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට තීරණය කිරීම නිසා, 2019 මැයි 23 දින අත්පත් කරන ලද ව්‍යාපෘතියෙහි ණය ගිවිසුමට අනුව ගෙවීමට සිදුවී තිබුණු රු.මිලියන 102.73 කට සමාන ජපන් යෙන් මිලියන 60.08 ක මුදල එනම් මුළු ණය මුදලින් සියයට 0.2 ක් වූ ඉදිරි ගාස්තු මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. එසේම, ණය ලබාදුන් ආයතනය වූ JICA ආයතනයට නැවත ගෙවිය යුතු ණය මුදල වූ රු.මිලියන 4,622.45 කට සමාන ජපන් යෙන් මිලියන 2,703.18 මුදල ගෙවීම සඳහා ගිවිසුමකට එළඹී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අනවශ්‍ය වියදම් දැරීම් වැලැක්වීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයේ භාරදීමට නියමිතව තිබුණු උපදේශන වාර්තා 16 කින් වාර්තා 11 ක් පමණක් භාරදී තිබුණු අතර භාරදුන් වාර්තාවලින්ද වාර්තා 7 ක් පමණක් ව්‍යාපෘතිය විසින් සමාලෝචනය කර තිබුණි. එසේ වුවත් උපදේශන සේවා ගිවිසුමට අනුව ප්‍රමාද වූ උපදේශන සේවා 5 වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අලාභ අයකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ගිවිසුම්වලට ඇතුලත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ඉතිරි උපදේශන වැඩ ඉටුකරවා ගැනීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කඩිනම්ව කටයුතු කළ යුතුය අතර, අලාභ අයකර ගැනීමට හැකිවනු පිණිස උපදේශන ගිවිසුම්වලට ප්‍රතිපාදන ඇතුලත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කොළඹ නගරයේ පවතින දැඩි රථවාහන තදබදයට පිළියමක් ලෙස ජපානයේ මූල්‍ය ආධාර යටතේ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය 2017 මැයි 01 දින ආරම්භ කරන ලදී. ඒ අනුව JICA ආයතනය මඟින් ලබාදෙන ලද රු.මිලියන 4,622.45 ක් හා රු.මිලියන 923.18 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදනද සමඟ රු.මිලියන 5,545.63 ක් 2020 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය සඳහා දරා තිබුණි. ව්‍යාපෘතියේ අධික පිරිවැය හා පිරිවැය සඵලදායී නොවීම යන කරුණු අංක : 20/1450/312/002 හා 2020 ඔක්තෝබර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කර ව්‍යාපෘතිය වසා දමා එහි සියලුම වත්කම් ප්‍රවාහන අමාත්‍යාංශය වෙත පවරා දීමට කටයුතු කර තිබුණි. මෙම නිසා ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු පිරිවැය ඵලරහිත වියදමක් බවට පත්ව තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය. |